**ශීර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 15 දින විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 134.12 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 57.91 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 76.21 ක් හෙවත් සියයට 56.82 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 84.79 | 53.30 | 31.49 | 37.14 |
| මූලධන | 49.33 | 4.61 | 44.72 | 90.65 |
| එකතුව | 134.12 | 57.91 | 76.21 | 56.82 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කාර්යාලයට අදාළ විෂය අංක 01901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.50 | 2.48 | 1.20 | 2.21 | 7.50 | 5.53 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

කාර්යාලය යටතේ වූ අංක 6000/0000/00/0013/0146/000 දරන තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.25,381 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ඇ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |

**3.2 අග්‍රිම ගිණුම**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව, ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම කර දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 07 කදී නිකුත් කර තිබුණු එකතුව රු.132,000 ක් වූ අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 16 සිට මාස 02 දක්වා කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**---------------------------**

කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් පෙන්වා දී තිබුණු භාණ්ඩ ඒකක 24 ක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමකින් තොරව බඩු වට්ටෝරු පොත්වලින් ඉවත් කර තිබුණි**.**

(ii) 2015 සහ 2016 වර්ෂ සඳහා පත්කර තිබුණු භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හඳුනා ගෙන තිබුණු භාණ්ඩ වර්ග 57 කට අයත් ඒකක 109 ක් මුදල් රෙගුලාසි 770 හි සඳහන් විධිවිධාන සහ 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විධිමත් ලෙස අපහරණය කර නොතිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**--------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවන් පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>මුදල් රෙගුලාසි 237(ඇ) හා මුදල් රෙගුලාසි 138(4) | වියදම් කිරීමට පෙර නියමිත අධිකාරී බලය හා අනුමැතිය ලබා නොගෙන, නිලධාරීන්ගේ පෞද්ගලික අභිමතය අනුව වියදම් කිරීමෙන් පසුව එම වියදම් සුළු මුදල් අග්‍රිමය මගින් ප්‍රතිපූරණය කර එකතුව රු.117,827 ක් වූ වවුචර් 21 ක් සහතික කර ගෙවීම් කර තිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 සහ 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | සමාලෝචිත වර්ෂය තුළදී රු.1,648,875 ක ප්‍රවාහන දීමනාද, රු.475,382 ක අතිකාල සහ නිවාඩුදින වැටුප්ද ගෙවා තිබුණු නමුත් සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් කාර්යාලයේ ස්ථාපිත කර නොතිබුණි. |

**(ඇ) වෙනත්**

| | |
|---|---|
| 2010 ඔක්තෝබර් 21 දිනැති පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක කාරක සභා තීරණයේ 05 ඡේදය | පස්වරු 6.30 න් පසුව පාර්ලිමේන්තු රැස්වීම් පැවති දිනයන්වල පමණක් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ඇතුළු පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ පිහිටි කාර්යාල 03 හි රැඳී සිටින නිලධාරීන් සඳහා රැස්වීම් දීමනා ගෙවිය හැකි වුවත්, පස්වරු 6.30 ට පෙර පිටවී ගිය සහ රැස්වීම් පැවති දිනවල පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ රාජකාරී නොකළ නිලධාරීන් 08 දෙනෙකු වෙත රැස්වීම් දීමනා වශයෙන් එකතුව රු.122,625 ක් ගෙවා තිබුණි. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

සමාලෝචිත වර්ෂය තුළදී එකක් රු.119,500 බැගින් මුළු පිරිවැය රු.956,000 ක් වූ ලැප්ටොප් පරිගණක 08 ක් මිලදී ගෙන තිබුණු අතර සැපයුම්කරු තෝරා ගැනීමට වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. නමුත් මිල ගණන් කැඳවීම, භාර ගැනීම, විවෘත කිරීම, ඇගයීම, තේරීම යන ප්‍රසම්පාදන කාර්යයන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුකර නොතිබුණු අතර, ලැබී තිබුණු මිල ගණන් අතරින් වැඩිම මිල ඉදිරිපත් කළ ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

## 3.6 විසඳා නොතිබුණු විගණන ඡේද

කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2013 | 1.6(ඇ)(ii) | පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |
| | 1.6(උ) | ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි. |
| 2014 | 1.1 | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

1.8 ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි.

### 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 12 | 10 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 18 | 13 | 05 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත්) | 41 | 14 | 27 |
| | **එකතුව** | **78** | **44** | **34** |